**ඔහු අප නොසිතූ තරම් වේලාසනින් නික්ම ගොසින්ය !**

ශ්‍රී ලංකාවේ හේතුවාදී ව්‍යාපාරයේ සමාරම්භක පුරෝගාමියා වූ **අචාර්ය ඒබ්‍රහම් තොමස් කොවූර්** සහ එකී හේතුවාදී සමාජ කතිකාවත ශ්‍රීලංකා සමාජයේ පාදම වෙත කැඳවාගෙන ආ **ධර්මපාල සේනාරත්නයන්ව** අප හඳුනා ගත්තේද ඔහුගේ එකී කෘතහස්ත වෑයම නිසාමය.

එදා සමාජයේ පැවති තවමත් පවතින ගතානුගතික මිත්‍යාව හා අවිචාරය කෙරෙහි වෙනස් ආකාරයෙන් , තර්කානුකූල පදනමකින් දකින්නට උත්සාහකල මිනිසුන් ඒ සඳහා පෙළඹවූ මුල්ම සිංහල කෘතීන් අතර ප්‍රමුඛවූයේත් - ජනප්‍රිය වූයේත් ඔහුගේ පරිවර්තන කාර්යයට බඳුන් වූ **“ මා කල ගවේෂණ ”** හා **“ දෙවියෝ සහ භූතයෝ ”** කෘති දෙකයි .

ඉන් අනතුරුව ඒ ඔස්සේ ඉදිරියට යමින් , සුමට භාෂා හසුරුවලීමක් සහිතව හේතුවාදී විෂයයට අදාළ , හේතුවාදී සාහිත්‍යය පෝෂණය කරන්නාවූ කෘතීන් හා ලිපි එකතුන් එලි දක්වා මෙම සමාජමය කටයුත්තට උර දුන්නේය .

අවසන් මොහොත වන තෙක් මිත්‍යාවට හා අවිචාරයට එරෙහිව , පුද්ගලික අභ්‍යාසයක මෙන්ම සමාජ භාවිතයක ද නියැලුණු මේ අපගේ වියපත් මිතුරා , අද සමාජයේ පවතින ආත්මාර්ථකාමී, පුද්ගලවාදී ජීවන විලාසයේ ඛේදවාචකයට එදිරිව , ප්‍රගතිගාමී සාමූහික කටයුතුත්තක නියලී ලබන සන්තුෂ්ටිය අප සමග භුක්ති වින්දේය .

සමාජයේ පවතින මිත්‍යාවට හා ආධානග්‍රාහී අගතීන්ට එරෙහිව දුෂ්කර අරගලයක නියැලෙන **ශ්‍රී ලංකා හේතුවාදී සංගමය** මීට සත් වසරකට පෙර යලි ප්‍රාණවත් කිරීමේ ව්‍යායාමයේදී අප සමග හවුල් වී එහි සභාපති ධූරය දැරූ **ධර්මපාල සේනාරත්නයන්** යලි උපතක් , පුනර්භවයක් හෝ පුනරුත්පත්තියක් නොමැති බව පසක් කොට සිටි නිසා , ලද ජීවිතය අර්ථවත් කරගැනුමටත් ඒ ජීවිතය මිත්‍යාවකට එරෙහි වන අරගලයකට දායක කිරීමටත් තම තරුණ අවදියේ සිටම තීරණය කොට තිබුණි .

ඉතින් මිතුර , ඔබ සමාජය වෙත දායක කල ඒ වටිනාකම් අපගේ සමාජ වෑයම සමගත් , ඒ වෑයමේ නියැලෙන අප වැනි මිනිසුන් අතරත් , හේතුවාදී සාහිත්‍යය තුලත් ජීවත් වන බැවින් ,

ඔබට

**සුභ රාත්‍රියක් කියා පමණක් මේ මොහොතේ අපි පවසමු !**

**ශ්‍රී ලංකා හේතුවාදී සංගමය**

**2011 දෙසැම්බර් 28**